ශාස්ත්‍රපති කුරුඳුගොඩ පඤ්ඤාසාර හිමි,

ශ්‍රී දළදා විහාරය,

මඩුකන්ද,

වවුනියාව.

2010. 12.

<u>ශ්‍රී දළදා විහරයේ ඉදිකරන ධර්ම පුස්තකාලය, චිත්ත විවේක මන්දිරය හා පොහෝ සීමාව පිළිබඳව යි.</u>

පිංවතුණි !

උතුරු පළාතේ වවුනියාව මඩුකන්ද ශ්‍රී දළාදා විහාරය අතීත ශ්‍රී ලාංකිය බෞද්ධ ජනතාවගේ අභිමානය කියාපාන පූජනීය බෞද්ධ සිද්ධස්ථානයකි. මෙහි එකී පූජනීය බව ක්‍රි : ව 312-315 දී පමණ හේමමාලා හා දන්ත කුමරු යන දම්පතීන් බෞද්ධයින්ගේ මුදුන් මල්කඩ ලෙස සලකන දැනට මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ ගෞරවණීයව වැඩ සිටින දන්ෂ්ට්‍රා දාතූන් වහන්සේ වැඩම කරවීමෙන් පූජනීය අතින් තවදුරටත් අති පිවිතුරු බවට පත්වී ඇත. එවන් පුණ්‍ය භූමිය වත්මනේ සුරක්ෂිත නටඹුන් බවට පත්ව ඇත. එම අවශේෂයන් දෙස බලා සිටිනා අපි ද උත්සාහවත් වන්නේ එකී අභිමානය ද ආරක්ෂාකරමින් වත්මන් හා අනාගත ශ්‍රී ලාංකික ජාතිය වෙනුවෙන් යමක් කිරීමේ සත්කාර්යටයි,

ඒ අතරට ජනතාව තුළ ධර්මඥානය ඇතිකරලීමට සුදුසු පරිදි කියවීම් ශාලාවක් සහිතව ධර්ම පුස්තකාලයක් වෙනුවෙන් ද, වසර 30කට ආසන්න කාලයක් පැවති යුද්ධය නිසා ඇතිව ඇති විවිධ සමාජගත ප්‍රශ්න හමුවේ මනෝමය වික්ෂිප්ත භාවයන්ට පත්ව අති විවිධ තරාතිරම්වල ජනකොටස්වලට සහනය ලබාගතහැකි චිත්ත විවේක මන්දිරයක් වෙනුවෙන් හා ප්‍රාදේශීය භික්ෂු මහා සංඝයාගේ විනය කර්ම කිරීම වෙනුවෙන් පොහෝ සීමාවක් ලෙස ද භාවිත කළ හැකි දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුත්තක් නවතම සත්කාර්ය ලෙස ආරම්භකර ඇත. එහෙත් මෙම ඉදිකිරීම නිමකිරීමට රු . ලක්ෂ 2647665 . 00 මුදලක් වැය වනබව ඇස්තමේන්තු ගතකර ඇත. දැනට එයින් රු. ලක්ෂ 13 ක් පමණ වැයකරමින් යම් පමණක කොටසක් ඉදිකර ඇති නමුත් එම මුදල ද මා ඉතා දුස්කරව සොයාගත් මුදලක් බව ද දන්වනු කැමැත්තෙමි. එබැවින් මම ඔබතුමන්ලාගේ කාරුණික අවධානයට මෙම ලිපිය යොමුකරන්නේ මා ඉතා දුස්කරව පුරන මෙම පාරමිතාවේ ඵල සමාජයට ලබාදෙන්නට යම් පමණකින් හෝ අප වෙත දායකත්වය ලබාදෙන ලෙසයි.

ඔබතුමාට,

දළදා සම්ඳු සරණයි.

මෙයට ශාසනකාමී

ශාස්ත්‍රපති කුරුඳුගොඩ පඤ්ඤාසාර හිමි    024-3240462/077-6012278